කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදි (විශේෂ) උපාධි තෙවන වසර පරීක්ෂණය (බාහිර)- 2021

2024 - අගෝස්තු

**BCOME 3072 - විගණනය සහ සහතික වීම**

ප්‍රශ්න සංඛ්‍යාව : (හයයි ) 06

කාලය : පැය 03 යි

පළමු ප්‍රශ්නය ඇතුලත්ව ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.

---

**ප්‍රශ්න අංක - 01**

සීමාසහිත දිල්රෝ පොදු සමාගම ශ්‍රී ලංකාවේ ලියාපදිංචි සහගත බතික් රෙදි පිළි කර්මාන්තයේ නිරත විශාල පරිමාණ සමාගමකි. සමාගම නිරූපණ සේවයේ නිරත අයවලුන් සඳහා නවතම බතික් විලාසිතා නිර්මාණය කිරීම, මැසීම සහ අලෙවිය සඳහා ලංකාව තුල ඉතාමත්ම ජනප්‍රිය සමාගමකි. බතික් කර්මාන්තය ශ්‍රී ලංකාව තුල තරඟකාරීත්වයෙන් අධික කර්මාන්තයක් වන අතර, තරඟකාරීබව ජය ගැනීමටනම් නිරන්තරයෙන් නව නිර්මාණ ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය සාධකයකි.

2023 වර්ෂය මැද භාගයේදී ලංකාව තුල බතික් විලාසිතා නැඹුරුව බතික් සාරි වූ අතර, එය ගනුදෙනුකරුවන් අතර වඩාත් ජනප්‍රිය විය. එබැවින් අදාළ ඉහල ඉල්ලුම සඳහා දිල්රෝ සමාගම විසින් අධික පිරිවැයක් දරා රු.මිලියන 25ක් වටිනා බතික් සාරි නිෂ්පාදනය කරන ලදී. කෙසේවෙතත්, 2023 අගභාගය වනවිට එහි ගනුදෙනුකරුවන් අතර අත් රහිත කාර්යාලීය ඇඳුම් (official wear) ඉතාමත් ජනප්‍රිය විය. 2023.12.31 වන දිනට සීමාසහිත දිල්රෝ පොදු සමාගමේ රුපියල් මිලියන 5ක් වටිනා බතික් සාරි තොගයක්ද, රුපියල් මිලියන 2ක් වටිනා කාර්යාලීය ඇඳුම් තොගයක්ද එහි ගබඩාවේ තිබුණේය.

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමාසහිත දිල්රෝ පොදු සමාගමේ විගණනය ඔබ වෙත පවරා ඇත.

ඇ) එකිනෙක සඳහා උදාහරණයක් බැගින් දෙමින් සීමාසහිත දිල්රෝ පොදු සමාගමේ අස්තිත්වය සහ එහි පරිසරය පිළිබඳව අවබෝධ කරගැනීමේදී ඔබ විසින් සලකා බැලීමට අවශ්‍ය කරන ව්‍යාපාරයේ පොදු ක්ෂේත්‍ර තුනක් හඳුනා දක්වන්න.

**(ලකුණු 06)**

ආ) i. විගණනය සැලසුම් කරන අවස්ථාවේදී ඔබ විසින් හඳුනා ගත යුතු තොග සම්බන්ධයෙන් වූ විගණන අවදානමක් විස්තර කරන්න.

**(ලකුණු 03)**

ii. ඉහත (i) අනුව හඳුනාගත් අවදානමට ප්‍රතිචාර ලෙස ඔබ විසින් ඉටුකරනු ලබන විගණන පටිපාටි දෙකක් පැහැදිලි කරන්න

**(ලකුණු 04)**

iii. සීමාසහිත දිල්රෝ පොදු සමාගමේ 2023 දෙසැම්බර් 31 වන දිනට තොග ශේෂය විගණනය කිරීමේදී, අවධානය යොමු කළ යුතු මූල්‍ය ප්‍රකාශන සැදහුම් (financial statements assertions) තුනක්, එක් එක් සැදහුම සඳහා ඉටු කළ යුතු විගණන පටිපාටියක්ද සමග පැහැදිලි කරන්න.

(ලකුණු 07)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක** - 02

අ) සහතික වීමේ කාර්යභාරයක මූලිකාංග පහ දක්වන්න.

**(ලකුණු 05)**

ආ) "විගණනයේදී මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන වලින් තොර බවට 100%ක තහවුරුවක් ලබා දීම විගණකගේ කාර්යභාරය වේ".

ඉහත ප්‍රකාශනය සහ ඔබ එකඟ වන්නේද? ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න.

**(ලකුණු 07)**

ඇ) "සාධාරණ සහතිකවීමේ කාර්යභාරයක්" සහ "සීමිත සහතිකවීමේ කාර්යභාරයක්" අතර වෙනස උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

**(ලකුණු 08)**

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක** - 03

සීමාසහිත ඉෂාරෝ පොදු සමාගම 2023/2024 මූල්‍ය වර්ෂය සඳහා ඔවුන්ගේ විගණක වශයෙන් R සහ T විගණක සමාගම පත් කිරීමට බලාපොරොත්තු වේ.

අ) ශ්‍රී ලංකා විගණන ප්‍රමිත අංක 210ට අනුව මෙකී විගණන කාර්යභාරයක් භාරගැනීමේදී R සහ T විගණක සමාගම විසින් පිළියෙළ කරනු ලබන විගණනය භාරගැනීමේ ලිපියෙහි ඇතුලත් විය යුතු අනිවාර්ය කරුණු 4ක් දක්වන්න.

**(ලකුණු 05)**

ආ) ඔබ ඉහත විගණන කාර්යභාරය සම්බන්ධව විගණක කළමනාකරු ලෙස පත් කර ඇති බව උපකල්පනය කරන්න. R සහ T විගණක සමාගම සහ මෑතකදී සම්බන්ධ වූ විගණක පුහුණුව ලබන පිරිස සඳහා සීමාසහිත ඉෂාරෝ පොදු සමාගමේ විගණනය හා සම්බන්ධව විගණනයේ සමස්ත අරමුණ පැහැදිලි කරන්න.

**(ලකුණු 07)**

ඇ) සීමාසහිත ඉෂාරෝ පොදු සමාගමෙහි විගණනයට අදාලව විගණන සමාගම විසින් ප්‍රදර්ශනය කළ යුතු මූලික ආචාර ධර්ම 4ක් විස්තර කරන්න.

**(ලකුණු 08)**
**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක - 04

අ) සීමාසහිත බොට්ල්ස් සමාගම විවිධ ප්‍රමාණයන්ගෙන් යුතු වීදුරු බෝතල් නිපදවීමේ ව්‍යාපාරයක නිරත වී සිටින අතර, සීමාසහිත ෆ්‍රැට් ජුස් සමාගම විවිධ පලතුරු වල රසයන්ගෙන් යුක්ත ෆ්‍රැට් ජුස් නිපදවීමේ ව්‍යාපාරයක නිරත වී සිටී. සීමාසහිත බෝට්ල්ස් සමාගම සහ සීමාසහිත ෆ්‍රැට් ජුස් සමාගම ඔවුන්ගේ ව්‍යාපාර ඒකාබද්ධ කර සීමාසහිත බොට්ල්ඩ් ෆ්‍රැට් ජුස් සමාගම නමැති තනි ව්‍යාපාරයක් පවත්වාගෙන යාමට තීරණය කරන ලදී. යෝජිත ඒකාබද්ධ කිරීමේ ගනුදෙනුව සඳහා සංකීර්ණ ගිනුම්කරණ මූලධර්ම සහ ව්‍යාපාර දෙකෙන්ම සැලකිය යුතු කළමනාකරණ මැදිහත්වීම් ඇතුලත් වෙතැයි අපේක්ෂා කෙරේ.

ඉහත සිද්ධිය මගින් සැළකිය යුතු විගණන අවදානමක් ඇතිකරනු ලැබේදැයි හේතු දක්වමින් පැහැදිලි කරන්න.

**(ලකුණු 10)**

ආ) විගණන මතය නිශ්චය කිරීමේදී විගණකවරුන් විසින් භාවිතා කරන සියලු තොරතුරු විගණන සාක්ෂි ලෙස දැක්විය හැකිය.

i. ප්‍රමාණවත් සහ යෝග්‍ය විගණන සාක්ෂි යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද?

**(ලකුණු 04)**

ii. මූල්‍ය ප්‍රකාශන සාවද්‍ය අවප්‍රකාෂණ ඇති වීමේ අවධානම සහ විගණන සාක්ෂි වල ප්‍රමාණාත්මකභාවය අතර අනුලෝම සම්බන්ධතාවයක් පවතී. මෙම ප්‍රකාශනය හා ඔබ එකඟ වන්නේද? ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න.

**(ලකුණු 06)**

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක - 05

විගණනයක ඇති ආවේණික සීමාවන් හේතු කොටගෙන ප්‍රමාණාත්මක වංචා සහ වැරදි අනාවරණය නොවීමෙන් මූල්‍ය ප්‍රකාශන වල සාවධ්‍ය ප්‍රකාශනයන් අඩංගු වීමේ නොවැළැක්විය හැකි අවදානමක් පවතී.

අ) විගණනයක ඇති ආවේණික සීමාවන් තුනක් සඳහන් කරන්න.

**(ලකුණු 03)**

ආ) මූල්‍ය ප්‍රකාශන වල වංචා හෝ වැරදි තිබෙන බවට හෝඩුවාවක් ලැබුන විටක විගණක විසින් අනුගමනය කල යුතු ක්‍රියාපටිපාටි පැහැදිලි කරන්න.

**(ලකුණු 07)**

ඇ) වංචාවක් හෝ වැරද්දක් පිලිබඳ සැකසහිත අවස්ථාවක ප්‍රතිඵලයක් ලෙස පැන නැගී ඇති සාවද්‍ය ප්‍රකාශයන් හේතුවෙන් විගණකට තම විගණන කාර්යභාරය පවත්වාගෙන් යා නොහැකි වීමේ විශේෂිත අවස්ථා පැන නැගිය හැක.

මෙවැනි අවස්ථාවක විගණක විසින් ගත යුතු පියවර පැහැදිලි කරන්න.

**(ලකුණු 10)**

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක - 06

පහත සඳහන් පද කෙටියෙන් පැහැදිලි කරන්න.

අ). වෘත්තීය විනිශ්චයකාරීබව (Professional Skepticism)

ආ). මූල්‍ය ප්‍රකාශ සැඳහුම් (Financial Statements Assertions)

ඇ). උචිත නාර්ණයක (Suitability Criteria)

ඈ). පුනරාවතර්න විගණනය (Recurring Audit)

ඉ). අපේක්ෂිත පරිශීලකයින් (Intended Users)

**(ලකුණු 04X05 = මුළු ලකුණු 20)**